

# 66 නිදහසට සම්ප්‍රවේශයක්

ශ්‍රී ලාංකේය විද්වත්
ශාස්ත්‍රීය ලිපි සංග්‍රහය

66 නිදහසට සම්ප්‍රවේශයක්

# උඩරට රාජ්‍යයේ බිඳවැටීම සහ ඉංග්‍රීසි ආධිපත්‍යයේ ආරම්භය

වර්ෂ 1815 දී උඩරට රාජ්‍යය බිඳවැටී දිවයින ඉංග්‍රීසි ආධිපත්‍යයට නතුවීමේ ක්‍රියාවලිය මේ ලිපියට වස්තුවිෂය වේ. මෙහිදී ඉංග්‍රීසි ආණ්ඩුකාර රොබට් බ්‍රවුන්රිග් මහනුවර නගරයට ඇතුළු වූ දින සිට එහි ඉංග්‍රීසි ආධිපත්‍යය පිහිටුවා පෙරළා කොළඹ බලා පිටත් වූ දින දක්වා වූ සති කිහිපය පිළිබඳ අවධානය යොමු කරනු ලැබේ. මේ කාලය තුළ උඩරට ගිවිසුම නම් වූ සම්මුතිය ප්‍රකාශයට පත්කිරීමත්, එයට උඩරට රදලයින්ගේ අත්සන් ලබාගැනීමත් සිදුකරනු ලැබූ අතර, එමගින් වසර 2300 ගණනක් තිස්සේ පැවති සිංහලේ රාජ්‍යත්වයේ අවසානය සනිටුහන් කළේ ය.

1815 පෙබරවාරි 14 වැනි දින බ්‍රවුන්රිග් ඉංග්‍රීසි හමුදා කණ්ඩයක් සමඟ මහනුවර නගරයට ඇතුළු විය. ඒ වනවිට ශ්‍රී වික්‍රමරාජසිංහ රජු ආරක්ෂාව පතා පලාගොස් සිටි අතර, නගරය ජනශූන්‍ය වී තිබුණේ ය. බ්‍රවුන්රිග් පත්තිරිප්පුවේ උඩුමහලේ ලැගුම් ගත් අතර මහනුවර සිටි කාලය පුරා ඔහුගේ වාසස්ථානය වූයේ එය ය.

මෙයට දින දෙකකට පෙර මහනුවරට ඇතුළු වී සිටි ජෝන් ඩොයිලි ද, දිනකට පෙර එහි පැමිණි ඇහැලේපොල ද රජු සෙවීමේ ලා සිය සහචරයන් මෙහෙයවූ හ. දුම්බර විවිධ ස්ථානවල රජු සැඟවී සිටින